# කවි කොළය



## පොත් බෑගය සමග පිස්තෝලය

නා හිමි නමක් පාසැල් යන දරුවන්ට
ඕනෑ බව කියා යුද පුහුණුව දෙන්ට
දන්වා සිටී හමුදා නායක යින්ට
ඇති මේ පිනම එතුමා මතු බුදු වන්ට

පොඩි දරුවනට දී ගිනි අවි අවි වාරේ
යුද පිටියට යවා මහ කොටි අව තාරේ
කළ අපරාද අපි දුටුවෙමු ගිය පාරේ
මෙතුමෝ වඩිත් කොටියා ගිය අඩි පාරේ

මල් මෙන් සුපිපි පිරිසිදු සිත් ඇති දරුවන්
ආයුධ අතට දී කරමින් මිනි මරුවන්
කළ අපරාධ එල් ටීටී මහ විරුවන්
නුදුටුද අපේ බුදු සසුනේ හිමි කරුවන්

අත දී තුවක්කුව උපදින දරු වාට
ඊශ්‍රායලය වැනි රටවල කෙරු වාට
ඉඩ දී බටහිරින් එන එක එක දේට
මේ බොදු රටෙත් උඩගෙඩි දෙනවද ඊට?

නොපෙනෙයි සැණෙන් ඔලුගෙඩියට වදින හෙනේ
මෙය හොඳ දෙයක් බව හමුදාපතිට පෙනේ
උපදින දෙමළ ළමයින්ටත් උතුරු කොණේ
මේ පුහුණුවම දෙනවද හාමුදුරු වනේ?

පාසැල් වියේ දරුවෙක් රයිපලය ගෙන
ඇතුළුව ළදරු පාසැලකට රටක වෙන
මැරුණා ළමුන් විසි ගණනක් ඉහත දින
මේකද? අපත් ඉල්ලන්නේ දෙසනු මැන!

යුද පුහුණුවක් දෙන විට කළ නොහැකි බොරු
පිරිවෙන් වල සිටින පොඩි හාමුදුරු වරු
වෙන හැටි අතට අරගෙන රයිපලය හුරු
මැවිලා පෙනෙයි අපහට හිමිසඳුනි ගරු

හිතවත! ඔබේ දරුවා
පාසැලට යන
පොත් බෑගය සමග
පිස්තෝලයද ගෙන
යුද පුහුණුව පිණිස
යනු ඇත ඉදිරි දින
මීහරකුන්ද අප
තණකොළ පිදුරු කන?



♦ තලන්ගම ජයසිංහ
Sri Lanka



ලංකාදීප 2010 ජූනි මස 28 වැනිදා සඳුදා 5 පිටුව

### පාසල් සිසුන්ට යුද පුහුණුවදීමේ යෝජනාව ගැන සලකා බලාගෙන යනවා

#### මල්වතු අනුනාහිමියන් කළ යෝජනාවකට යුද හමුදාපති පිළිතුරු දෙමින් කියයි

(ජේ.ඒ. එල්. ජයසිංහ)

ලෝකයේ වෙනත් රටවල මෙන් ශ්‍රී ලංකාවේද පාසල් සිසු දරුවන්ට යුද හමුදා පුහුණුව අනිවාර්ය කළ යුතු බවත් එමගින් මෙරට තරුණ පරපුර විනය ගරුක පුරවැසියන් පිරිසක් බවට පත්වීමෙන් රටේ සමාජයේ විනය ආරක්ෂා වන බවත් නියංගොඩ විජිතසිරි මල්වතු අනුනාහිමියෝ තමන් වහන්සේ බැහැ දැකීමට පැමිණි යුද හමුදාපති ලුතිනන් ජනරාල් ජගත් ජයසූරිය මහතා හමුවේ (26) පැවසූහ.

මෙහිදී මල්වතු අනුනාහිමියන් හමුවේ අදහස් දැක්වූ යුද හමුදාපතිවරයා එම යෝජනාව පිළිබඳව දැනටමත් සලකා බලමින් තිබෙන බව පැවසීය.

ශ්‍රී ලංකාවේ යුද හමුදාව පිළිබඳව පිට රටවල් පවා පැහැදී සිටින බව කී හමුදාපතිවරයා යුද හමුදා ඉංජිනේරු බලකායේ නිලධාරීන් වැඩි රාජ්‍යයට හා ලෙබනන්හි සේවයට යැවූ බවද කීය.

දැන් ඉතින් පැවරී ඇත්තේ රට ගොඩ නැගීමේ කාර්යය බැවින් ඒ සඳහා ද යුද හමුදාව දායකත්වය ලබාදිය යුතු බව මල්වතු අනුනාහිමියෝ හමුදාපතිවරයාට පැවසූහ.

## පාසැල් සිසුන්ට අනිවාර්ය යුද පුහුණුව?

සමාජයේ දිනෙන් දින වන විනය පිරිහීමට ප්‍රතිකර්ම වශයෙන් ලංකාවේ සියළු පාසැල් සිසුන්ට යුද පුහුණුව අනිවාර්ය කරන්නටයයි මල්වතු පාර්ශවයේ අනුනාහිමියන් වහන්සේ නමක් හමුදාපති ලුතිනන් ජෙනරාල් ජගත් ජයසූරිය මහතාගෙන් ඉල්ලා සිටි බව නොබෝදා ශ්‍රීලංකාවේ පුවත්පත් වල පළවිය. අනුනාහිමියන් බැහැදකින්නට ගිය හමුදාපතිවරයා එය අසා එම කාරණාව ගැන දැනටමත් සිතා බලා ඇති බව කියා ඇත. එහෙත් එවැන්නක් වුවහොත් එය විනය රැකීම කෙසේ වෙතත් අනාගතයේ ලංකා සමාජයේ නොසිතූ විරූ ප්‍රශ්න ඇතිවීමට හේතුවක් වනු ඇතියි විද්වත්හු පවසති. හමුදාවට අදාල දේවල් වෙනත් අංශවලින් ප්‍රකාශ වනු මිස එය සංඝයා වහන්සේලාට අදාළ කාරණයක් නොවන බව ඇතැම් අයගේ මතයයි. ඉහත දැක්වෙන්නේ ලංකාදීප පුවත්පතේ පළවූ එම ප්‍රවෘත්තියයි.

## විමල් උපවාසය අත්හරී





*කැබිනට් අමාත්‍ය විමල් වීරවංශ මහතා පසුගිය වසරේ විදේශ ගමනක යෙදුණු විටෙක එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන්කි මූන් මහතා හමුවූ අවස්ථාවයි මේ. ශ්‍රීලංකා ජනාධිපතිතුමාද එවක විදේශ ඇමති බෝගොල්ලගම මහතා ද මේ පින්තූරයේ වෙති.*

ශ්‍රීලංකාව නොරුස්සන ඇමරිකාව ඇතුළු ඇතුළු යුරෝපයේ රටවල් කීපයක හා කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාවේ බලපෑම් මත එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා වන බැන්කි මූන් විසින් පත් කරන ලද විශේෂ කමිටුවක් සූදානම් වූයේ ලංකාවට පැමිණ ශ්‍රීලංකාවේ යුද්ධය නිමා කළ අවසන් අදියරේදී සිදු වූවා යයි කියන නිශ්චිත නැති යුද අපරාධ වගයක් ගැන සොයා බලන්නටය. එයට එරෙහිව කොළම පැවති උද්ඝෝෂණයේදී ඇමති විමල් වීරවංශ මහතා ඒ කමිටුව අහෝසි කරන තුරු මාරාන්තික උපවාසයක් අරඹන බව කියා එහි නිරතවිය. දින දෙකකට පසු ජනාධිපතිවරයාගේ ඉල්ලීම මත ඒ උපවාසය අවසාන විය.



**ඉරිදා- SUN** අපේ අම්ම අද අතින්ම ලියලා මට ලියුමක් එවලා තිබුණා. වෙනදට ලොකු නංගිට කියලයි ලියවලා එවන්නෙ. අම්මට ලියුම් ලියන්න අමාරු වග මම දන්නව ඒත් වචන දෙක තුනක් හරි ඇදවෙවී කියව ගන්න බැරි පුළුවන් විදියට හරි එවන්න කියලා මම අම්මට කියපු නිසා ලියුමක් ලියලා. පොසොන් වලට අනුරාධපුරේ ගිය විස්තරයක් ඒකෙ තිබුණා. කැතරින් නැන්දලත් ගිහිං. ඒක හොදයි. අම්ම එහේදි සිල් අරගෙන තියෙනවා. බටේමුල්ලෙ අපේ ඇත නැදැයො වගේකුත් එහේදි හම්බවුනාලු. බුදුන් වැදලා දෙවියන්ට පින් දෙන ගමන් ලන්ඩන් වල ඉන්න අපිටත් සෙත්පැතුවයි කියලා අම්ම ලියලා තිබුණා. ඒක කියවපු ගමන් මට ඇඬුණා.

**සඳුදා- MON** ලංකාවෙ යුද්ද තියෙන කාලෙට වැඩිය යුද්දෙ නැති මේ කාලෙ ලංකාවට ප්‍රශ්න වැඩියි. මුළු ලෝකෙම ඉන්න යක්සෙයො, පෙරේතෙයො, කුම්භාණ්ඩෙයො, මදුරුවො, හෝ හපුටුවො, ගොබ්බෙයො, ඇටිකිච්චො සේරම කෙළ හල හල ලංකාව දිහා බලාගෙනයි ඉන්නෙ? හරි පුදුම වැඩක්. මට මතක්වෙනවා පුංචි කාලෙ අපේ ආත්තම්ම කැවුම් පිහන කොට ඉස්සෙල්ලම පිහපු කැවුම මට දීලා කියනවා, “ හින්නි දුවේ...මේක ගේ ඇතුළෙ තියා ගෙන කාපං....එළියට එහෙම යන්න එපා... පෙරේතෙයො කුම්භාණ්ඩෙයො බලාගෙන ඉන්නවා.... එහෙම වුනොත් උඹ ලෙඩ වේවි...” කියලා. ඒ ආත්තම්ම කියපු දේම තමයි දැන් අපේ රටට වෙලා තියෙන්නෙ! පෙරේත දිස්ටිය.

**කුජදා - TUE** ඊයෙ හවස මම පොඩ්ඩුවට එයාගෙ ඉස්කෝලෙ ප්‍රොජෙක්ට් එකට උදව් වෙවී ඉන්න කොට, කවුද බෙල් එක ගැහුවා. බැලින්නම් රෝහිණී. එයා හැමර්ස්මිත් ඇස්ඩා එකට යන ගමන් නිකං අපිව බලල යන්න ආවයි කිව්වා. සාලෙ තියන අපේ පුටු ටික අතගාලා අහනවා, මේවා ඇන්ටික්ද? කියලා. එයාලගෙ මමී ඊ එච් කුරේලට ඕඩර් එකක් දුන්නලු ඒගොල්ලන්ට ඇන්ටික් කවිච්චියකුයි, ඇන්ටික් පුටු හයකුයි හදවන්න. ලබන මාසෙ ඒ බඩු ලන්ඩන් වලට ෂිප් කරාවිය කිව්වා. හැබැට බොලේ මං දැනං හිටියෙ නැනේ මොරටුවෙ බාස්ලට ඇන්ටික් බඩු හදන්න පුළුවන් විත්තිය!

**බුදදා- WED** විමල් වීරවංශගෙ උපවාස කිරීමට විපක්ෂයෙ කස්ටිය හිනා වෙලා තිබුණා, අලි බොරුවක් කළාය කියලා. සමහරු එහෙම හිතන්නෙ නැහැ. ලංකාව යුද්ධ අපරාධ වලට හංවඩු ගහන්න යනකොට එක්කෙනෙක් නෙවෙයි, හරි නම් මුළු ලංකාවම නැගිටලා කියන්න ඕන අපි සේරම මැරෙනවා රණවිරුවන්ට එහෙම අතක් තිව්වොත් කියලා. මං හිතන්නෙ නැහැ දැන් රණවිරුවන්ගෙ අගයක් ලංකාවෙ හුඟ දෙනෙකුට තියනවයි කියලා. හිටපු හමුදාපති පවා කියනව නම් මම ඕන තැනක ගිහිං හමුදාව මිනීමැරුවයි කියලා සාක්කි දෙනවයි කියලා, මේ සත පහක් නොවටින පොලිටික්කො එකෙක් ඉදිරියට එයි ද රට බේරගන්න? තමන්ගෙ රටේ රජ්ජුරුවො ඇද ගෙන ඇවිල්ලා, අත පය ගැටගහලා සුද්දන්ගෙ කකුල් දෙක ළඟට ගෙනැත් විසිකරපු ජාතියක් මේ. වෙන දේවල් කියන්න අවශ්‍ය නැහැ. ඒක ඇති.

**ගුරුදා - THU** ලංකාවට කතා කරපු වෙලාවෙ සුවර්ණා නංගි කියපු කතාවෙන් අද ලංකාවෙ තත්වෙ ගැන මම හිතා ගත්තා. ඒ ගෙදර වහළ හදන්න ආපු බාසුන්නැහෙ එදා කලන්තෙ හැදිලා වැටිලා. හොඳ වෙලාවට බිම තිබුණු පරණ ගුදිරියක් උඩට. පස්සෙයි දන්නෙ ඒ මනුස්සෙයා දවස් දෙකකින් හරියට කාලා නැහැ. ලංකාවෙ බඩු ගිනි ගණන්. සාමාන්‍ය මිනිස්සුන්ට ජීවත්වෙන්න අමාරුයි. අද අපේ රටේ හුඟක්දෙනා හරි කෑමක් නැතුව පුදුම පීඩනයකින් ඉන්නෙ. මිනිස්සු මේ සේරම තියෙද්දිත් රජයට සහාය දුන්නා. රජය ඒ මිනිස්සු දිහා ඇහැක් ඇරලා බලන්නෙ නෑ. ඇමතිවරු කරන්නෙ ලොකු බොරුවක්. ඔහොම ගියොත් ළඟදිම ආණ්ඩුව වළ කපාගන්නවා.

**කිවිදා- FRI** නැබඩ සීලවතී කුඩම්මා කොළඹ ලොකු තරුපහේ හෝටලේක තිබ්බ්ච වෙඩිං එකකට ගිහින් ඇවිත් දැන් කාලෙ කසාද බඳිනකොට කරන විකාර වියදම් ගැන දිග විස්තරයක් ලියලා එවලා. මනමාලිට අන්දවන්න විතරක් රුපියල් එක්ලක්ෂ විසිපන්දාහක් අරගෙනලු. වේල් එක හැතැප්ම කාලක් විතර දිගලු. ශාලාව ඇතුළට අලියෙකුත් ගෙනැල්ලා. මනමාලයා ආවේ අලිය පිටලු. (කුඩම්මගෙන් අහලා යවන්න ඕන අලිය බෝ ටයිඑකකුත් දාලාද හිටියෙ කියලා)කුඩම්මා අන්තිමට ලියලා තිබුණේ...“අපේ මගුලට දුවේ ඔය අන්දවන්නයි මල් බොකේ වලටයි උත්සව වලටයි කියලා තඹ සතයක් වියදම් වුණේ නෑ” කියලා. ඒකට හේතුවත් මම දන්නවා. කුඩම්මා විල්සන් බාප්පත් එක්ක පැනලා ගිහිං තියෙන්නෙ ඇඳන් හිටි රෙදි පිටින්ම කම්බි වැටෙන් රිංගලා හඳපානෙ.

**ශනිදා - SAT** රන්ජනී ළඟදි බස්එකේ පකිස්ථාන් ගෑණු කෙනෙක් අඬඅඬා යනව දැකලා ඒසීට් එකට ගිහිං ඇහුවලු Can I help you? කියලා. ඒ ගෑණි රවලා බලලා. එතකොටයි රන්ජනී දැකලා තියෙන්නෙ සාරියෙන් වැහිච්ච මොබයිල් පෝන් එක. ඒගෑණි කාටද දුක කියනවා. මම රන්ජනීට කිව්වා මීට පස්සෙ පැනලා දෙන්න යන්න එපා කියලා.